**වැලිමඩ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමි වටිනාකම රු.1,004,600 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන ඉතිරි ලිපිද්‍රව්‍ය වටිනාකම රු.124,600 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ උසාවි දඩ මුදල් රු.163,107 කින් සමාලෝචිත වර්ෂයේ වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් රු.1,594,049 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද තොග ලෙස රු.2,198,170 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුනද, භෞතිකය එවැනි තොගයක් නිරීක්ෂණය නොවීය.

(ඊ) ඉකුත් වර්ෂයේ අවසන් වාර්තාවෙන් දක්වා තිබූ පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු ප්‍රවර්තන වර්ෂයේ දී නිවැරදි කර නොතිබිණි.

   (i) වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත්පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.16,055 ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබීම.

   (ii) වර්ෂය තුළ මිලදී ගත් රු.5,190 ක් වටිනා පුස්තකාල පොත් 13 ක් වත්කම් ගිණුම්වල සහ ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ඇතුළත් කර නොතිබීම.

1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

----------------------------

මුදල් පොත අනුව ශේෂය සහ බැංකු සැසඳුම් ප්‍රකාශය අතර රු.33,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.30,600,187 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.23,327,991 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු. 44,128,766 ක් වටිනා ගිණුම් විෂයන් 08 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය 149 වගන්තිය | වාහන සේවා ස්ථානය සඳහා වෙළෙඳ බලපත්‍රයක් සභාපනතේ ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර විධිවිධාන පනත | 2016 වර්ෂය සඳහා රු.1,400 ක මුද්දර ගාස්තු දේශීය ගාස්තු ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| | (i) 156 වන රීතිය | විශ්ලේෂණ තීරු සහිතව මුදල් ගෙවීම් පොත පිළියෙල කර නොතිබිණි. |
| | (ii) 218 වන රීතිය | වර්ෂයකට වරක් ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු. රෙ.371 | 2000 වර්ෂයට පෙර සිට සභාව විසින් අවස්ථා 32 කදී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද අත්තිකාරම් රු.1,443,191 ක් 2016 දෙසැම්බර් 31 වන විටද පියවා නොතිබුණි. |
| | (ii) මු.රෙ. 396(ඇ) | නිකුත් කළ නමුත් ගිණුමට හර නොවූ රු.2,385 ක් වටිනා චෙක්පත් 04 සම්බන්ධයෙන් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබිණි. |
| | (iii) මු.රෙ. 571 | වසර 2 ක කාලයක් ඉක්මවූ රු.7,310,970 ක් වටිනා පොදු තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | මු.රෙ. 757(2) | ගබඩා ඌනතා හඳුනාගෙන ඒවා සඳහා වගකිව යුතු නිලධාරින්ගෙන් අයකරගත යුතු වුවත් කැප්පෙටිපොල උප කාර්යාලයේ එසේ සිදුකර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | රු.95,140 ක සේවක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2002 දෙසැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ | පරිගණක 14 ක් හා ඊට අදාල උපාංග වෙනුවෙන් IAI/2002/02 ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (උ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 චක්‍රලේඛයේ 2.1 ඡේදය | වැලිමඩ ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා ඇඟිලි සලකුණු කටයුතු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |
| (ඌ) | රාජ්‍ය පරිපාලන හා පරීක්ෂාව කර නොතිබුණි. අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | සභාව සතු වාහන 11 ක ඉන්ධන දහනය පිළිබඳ ස්වදේශ කටයුතු |
| (එ) | රාජ්‍ය සේවා කොමිෂන් ලේකම්ගේ අංක 1589/30 හා 2009 පෙබරවාරි 20 දිනැති ගැසට් පත්‍රයේ XVIII පරිච්ඡේදය හා ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.2 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව නිලධරයන් 5 සභාවේ දෙනෙකු වසර 05 කට වැඩි කාලයක් වැලිමඩ ප්‍රාදේශීය සභාවේ සේවයට අනුයුක්ත කර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,918,028 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,651,504 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

(අ) ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී පැවැති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ දැන්වීම් ප්‍රදර්ශනය වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද, 2017 ජනවාරි 24 දින වන විටත් අදාල ගාස්තු අයකරගෙන නොතිබුණි. සභා බල ප්‍රදේශය තුළ එවැනි දැන්වීම් පුවරු 12 ක් ඇති බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

2.2.2 **බදු කුලී**

---------

ටෙන්ඩර් කඩ කුලී රු.1,293,950 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවෙන් හා සභාවේ අනෙකුත් ආයතන වලින් ලැබිය යුතුව තිබුණු උසාවි දඩ සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,094,990 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

(අ) රු.2,713,446 ක් වටිනා වැටුප් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) ඇපකරුවන් නොමැතිව රු.85,211 ක ආපදා ණයක් ගෙවා තිබුණු අතර, මෙම මුදල මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

(අ) අත් ට්‍රැක්ටර් 02 ක් ජල බවුසරයක්, ටැක්ටරයක්, ගිනි නිවීමේ රථයක්, ට්‍රැක්ටර් ට්‍රේලරයක් හා නඟුලක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව තිබුණි.

(ආ) ජංගම ගිණුම්වල නිෂ්කාර්යව පැවැති මුදල රු.6,300,495 ක් විය.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

----------------------

2016 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම්කරණය
(ඇ) ණය ගැතියෝ සහ ණයහිමියෝ